# පොදු අපේක්ෂකයා

මේ දිනවල නැවත වතාවක් පොදු අපේක්ෂක කතාව ඉදිරියට පැමිණ ඇත. මිළඟ ජනාධිපතිවරණයේ දී විපක්ෂයෙන් පොදු අපේක්ෂකයකු ඉදිරිපත්කිරීමට ඇතැමුන්ට අවශ්‍ය වී ඇති බව පෙනෙයි. මේ සම්බන්ධයෙන් කරුණු දෙකක් පැහැදිලි ය. පළමුවෙන් ම පොදු අපේක්ෂක කතාව ඉදිරිපත් කෙරෙන්නේ බංකොලොත් දේශපාලන පක්ෂවලින් බව ය. දෙවැන්න පොදු අපේක්ෂකයා ඉදිරිපත් කෙරෙන්නේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට එරෙහිව ඔහු පරාජය කිරීමේ එකම චේතනාවෙන් බව ය. තමන්ගේ ම අපේක්ෂකයකු ඉදිරිපත් කර මිළඟ ජනාධිපතිවරණයෙහි දී ජයගැනීමට නොහැකි බව දන්නා යන එන මං නැති දේශපාලන පක්ෂ පොදු අපේක්ෂකයකු ඉදිරිපත් කිරීමට සැරසෙන්නේ තම පක්ෂ පරාජය වීම වළක්වා ගැනීමට ය. පොදු අපේක්ෂකයා පරාජය වුව ද තම පක්ෂය නිල වශයෙන් පරාජය නොවන බව දන්නා මේ නන්නත්තාර වී ඇති දේශපාලන පක්ෂවලට ජනාධිපතිවරණයෙන් පසු තම පක්ෂය පරාජය නොවිණි යැයි හිත හදාගැනීමට හැකි ය. අද ජ වි පෙ පමණක් නොව එ ජා පක්ෂය ද දේශපාලන ලෝකයේ අතරමං වී ඇති පක්ෂ වෙයි. ආරම්භයේ සිට ම ජාතිකත්වය හා කසිකබල් මාක්ස්වාදය අතර දෝලනය වන ජ වි පෙරමුණට අද ජනාධිපතිවරණයකට ඉදිරිපත් වී සියයට දෙකකවත් ඡන්ද ගැනීමට නො හැකි ය. පළාත් සභා ඡන්දවල දී එ පක්ෂයට ලැබුණු ඡන්ද ප්‍රමාණයවත් ජනාධිපතිවරණයක දී නොලැබෙනු ඇත. ජාතිකත්වයෙන් කසිකබල් මාක්ස්වාදයට දෝලනය වන කාල පරිච්ඡෙදයෙහි දී ජ වි පෙරමුණට ඇත්තේ සිය දිවි නසාගැනීමේ විකල්පය පමණකි.

එ ජා පක්ෂයට රනිල් වික්‍රමසිංහ මහතාගේ නායකත්වයෙන් එ මහතා ජනාධිපතිවරණයේ දී තම අපේක්ෂකයා බවට පත්කරගෙන ජයග්‍රහණය කළ නොහැකි බව එ පක්ෂයේ බොහෝ දෙනෙකුට තේරෙන කරුණකි. එ බව නොතේරෙන්නේ රනිල් වික්‍රමසිංහ මහතාට හා පක්ෂයේ තවත් කිහිප දෙනකුට පමණක් විය හැකි ය. අනෙක් පිරිසගෙන් යම් ප්‍රමාණයක් ඇතැම් විට පක්ෂයේ වෙනත් අපේක්ෂකයකු ඉදිරිපත්කර ජයග්‍රහණය කිරීමට බලාපොරොත්තු වනවා විය හැකි ය. එහෙත් එ ජා පක්ෂයේ කිසිවකුට පක්ෂයෙන් තරඟ කර මහින්ද රාජපක්ෂ මහතා පරාජය කිරීමට නොහැකි බව දන්නා අය ද පක්ෂයේ වෙති. ඊනියා පොදු අපේක්ෂකයා එවැන්නන්ගේ දෙසවනට දිව මතුරකි. එ අතර පොදු අපේක්ෂකයාට තල්ලුව දෙන තවත් අය ද වෙති. ඔවුන් අතර විදේශීය බලවේග හා දෙමළ ජාතිවාදී සංවිධාන හා සිංහල බෞද්ධ විරෝධී රාජ්‍ය නොවන සංවිධාන පමණක් නොව ඇතැම් ආගමික නායකයෝ ද වෙති. අද එක් සභාවක නායකත්වය දරන්නේ රෝමයේ දී කොටි සංවිධානය වෙනුවෙන් යාඥා පැවැත්වූ පූජකවරයෙකි. අද ඔහු මහින්ද රාජපක්ෂ මහතා වෙනුවෙන් බොරුවට යාඥා කරනු දැකිය හැකි ය. දෙවියන් වහන්සේට යාඥා කරනු වෙනුවට ඔහු යුරෝපීය රාජ්‍ය නායකයන්ට යාඥා කරන්නේ අනෙක් අතින් එ නායකයන්ට වෙනත් පණිවුඩ යවමින් බවට සැකයක් නැත.

පොදු අපේක්ෂකයා ගැන දොඩවන සියළු දෙනාට ම පොදු අපේක්ෂාවක් ඇත. එ මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපතිවරණයේ දී පරාජය කිරීම ය. එමගින් සිංහලත්වය දියකර දැමීම ය. සිංහල බෞද්ධ සංස්කෘතියට මෙරට හිමිවිය යුතු එහෙත් තවමත් හිමි නොවුණු තැන කිසි දිනෙක ලබා නොදීමට කටයුතු කිරීම ය. පොදු අපේක්ෂකයා කවුරුන් වුවත් ඔහු ඉදිරිපත් කෙරෙන්නේ ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකර ගැනීමේ පරම පවිත්‍ර චේතනාවෙනි. පොදු අපේක්ෂකයා බවට ඉදිරිපත්වීමට තීරණය කරන්නා දැන හෝ නොදැන හෝ එ කරුණු සඳහා පෙනී සිටියි. මේ උදා වී ඇත්තේ දෙවැනි පනස්හයකි. තවත් අවුරුදු පනහකින් පමණ තවත් පනස්හයක් උදාවනු ඇත. එ අතර කාලයෙහි දී විවිධ දෑ මෙරට හා ලෝකයේ සිදුවන බව අමුතුවෙන් කිවයුතු නො වේ. පනස්නවය වන විට පනස්හය ආපසු හැරවීමට විජාතික බලවේග ක්‍රියාකළ අන්දමට මේ දිනවල දෙවැනි පනස්හය ආපසු හැරවීමට ද එ බලවේග ක්‍රියාත්මක වෙමින් පවතියි. ම එ පෙරමුණු ආණ්ඩුවෙන් පිලිප් ගුණවර්ධන මහතාට ඉවත්වීමට සැලැස්වීම පනස්හයට විරුද්ධව ගත් ප්‍රධාන පියවරක් විය. වැඩිකල් නොගොස් බණ්ඩාරනායක මහතා ඝාතනය කෙරිණි. විජාතික බලවේගවල අද සැලැස්ම මේ ආණ්ඩුව අපකීර්තියට පත්කර අස්ථාවර කර මහින්ද රාජපක්ෂ මහතා පරාජය කිරීම ය.

මේ ආණ්ඩුව කරන කියන ඇතැම් දෙයක් ගැන අපට එකඟ විය නො හැකි ය. අද ආණ්ඩුවට අවශ්‍ය වන්නේ රාජ්‍ය මාධ්‍ය ඔස්සේ ජනාධිපතිතුමාට ස්තෝත්‍ර ගයන වන්දිභට්ටයන් නො වේ. මේ වන්දිභට්ටයෝ බොහෝ දෙනෙක් විජාතික බලවේගවල නියෝජිතවරියක වූ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට ද ස්තෝත්‍ර ගැයූහ. ඇතැම්හු ප්‍රේමදාස මහතාට ද ස්තෝත්‍ර ගැයුවෝ වෙති. ආණ්ඩුවට අද අවශ්‍ය වන්නේ වෙනත් කාහටත් වඩා ජාතිකත්ව මතවාදයක සිට නිර්මාණාත්මක විවේචනයෙහි යෙදෙන්නවුන් ය. ජනාධිපති උපදේශකයන්ගේ වගකීම් අතර ජනාධිපති විවේචනය ද

© Prof. Nalin De Silva

විය යුතු ය. අද නොයෙකුත් සංවර්ධන කටයුතු කෙරෙන බව සැබෑ ය. එහෙත් මේ සංවර්ධනයේ කතා නොකෙරෙන දෙපැත්තක් වෙයි. එකක් ඒ හා සම්බන්ධ නාස්තිය හා දූෂණය ය. දෙවැන්න මේ සංවර්ධනය ජාතික සංවර්ධනයක් ද නැත්නම් විජාතික සංවර්ධනයක් ද යන්න ය. කාලයක් තිස්සේ බොහෝ දෙනාට පුරුදු කෙරී ඇත්තේ ඇමරිකාව මෙන් බැරිනම් අඩු තරමින් සිංගප්පුරුව මෙන් දියුණු විය යුතු බව ය. සිංගප්පුරුවේ අහස උසට ගොඩනැගුණු කුකුල් කූඩු මහල් නිවෙස්වල සිරවුණු ජීවිත දියුණුවේ ලක්ෂණයක් නම් දියුණු නොවී සිටීම එයට වඩා අගනේ ය. ආණ්ඩුවේ ඇතැම් ක්‍රියාකාරකම් ගැන එකඟ නොවන අතර ආණ්ඩුව පැරදවීමට ද අපට එකඟ විය නො හැකි ය. ආණ්ඩුව පවතින්නේ මහින්ද රාජපක්ෂ මහතා වටා ය. ආණ්ඩුව මැතිවරණ දිනන්නේ අර ඇමතිවරයා මේ ඇමතිවරයා රටට කළ සේවයක් නිසා නොව රාජපක්ෂ මහතාගේ නායකත්වය නිසා ය. මිළඟ මැතිවරණයේ දී මහින්ද රාජපක්ෂ මහතාට කළ හැකි කාර්යයක් වෙයි. මන්ත්‍රීධුරාපේක්ෂකයන් තෝරණ විට දූෂිතයන්, හොරුන්, තක්කඩියන් ආදීන් ප්‍රතික්ෂෙපකිරීමට ඒ මහතා ක්‍රියාකරන්නේ නම් එය ම රටේ යහපතට හේතුවනු ඇත. හොරුන් දූෂිතයන් නැතිව ජාතික සංවර්ධන මාවතක් දිගේ අවුරුදු පහක් රට ගෙනයෑමට හැකි නම් අපට ජයග්‍රහණ රාශියක් අත්කර ගැනුමට හැකිවනු ඇත. කෙසේ වෙතත් ආණ්ඩුව තවදුරටත් ජාතියේ නාඩි වැටෙන ආකාරය තේරුම්ගෙන ක්‍රියාකළ යුතු ය.

ආණ්ඩුව ජෙනරාල් සරත් ෆොන්සේකා මහතාට දෙන ලද උසස් වීම මතභේදයට තුඩුදෙන්නකි. උසස්වීම ඔස්සේ ඒ මහතා හමුදාපති ධුරයෙන් ඉවත්කෙරුණු බව පෙනෙන්නට ඇත. සරත් ෆොන්සේකා මහතා ඉවත්කිරීම, දයාන් ජයතිලක එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ජෙනීවා නුවර ලංකා නියෝජිත තනතුරින් ඉවත්කිරීමට වඩා වෙනස් ය. දයාන් ජයතිලක ඒ තනතුරට සුදුස්සෙක් නො වී ය. මෙරට ඉංගිරිසි කතාකරන ඇතැම් බකපණ්ඩිතයන්ට ඔහු ප්‍රාඥයකු විය හැකි වුව ද ඔහු මෙරට සංස්කෘතිය මත පා ගහගත් පුද්ගලයෙක් නො වේ. බටහිර මතිමතාන්තර හැරෙන්නට ඔහු දන්නා දෙයක් නැත. එහෙත් සරත් ෆොන්සේකා මහතා එසේ නො වේ. මෙරට ඉතිහාසය දත් අපේ සංස්කෘතිය ගැන වැටහීමක් ඇති ඒ මහතා හමුදාපති ධුරයට පත්වී තිබුණේ සුදුසු ම අවස්ථාවේ ය. මහින්ද රාජපක්ෂ මහතා ද ඔහුගේ අගය දැනගෙන සිටි බවට සැකයක් නැත. ඔහුගේ සේවය දිර්ඝකිරීම පිළිබඳ කිසිදු ගැටලුවක් මතු නොවූයේ ද එබැවිනි. කවුරු කෙසේ කීවත් කොටි පරාජය කිරීමේ ප්‍රධාන ගෞරවය ජනාධිපතිතුමාට හිමිවිය යුතු ය. විජාතික බලවේගවලට දණ නොනමා දෙන ලද දේශපාලන නායකත්වය නොවන්නට ජයග්‍රහණය අත්කර ගැනීමට නො හැකි ය. එමෙන් ම ගෝඨාභය රාජපක්ෂ මහතා ද එහි දී ඉතා විශිෂ්ට සේවයක් කෙළේ ය. ඔහු පැරණි ලංකාවේ නම් අසිග්ගාහක වෙයි. ගැමුණු රජ සමයෙහි එවැනි පදවියක් තිබී නැතැයි සිතමි. ඒ ගෞරවය ඒ මහත්වරුන්ට එසේ පිරිනමද්දී සරත් ෆොන්සේකා මහතාට හිමිවිය යුතු ගෞරවය අබමල් රේණුවකින්වත් අඩු නොකිරීමට අප වග බලාගත යුතු ය. ගැමුණු රජු එළාර පරාජය කළ වීරයා වන අතර අප කිසිවකුට අවුරුදු දහස් ගණනකට පසුව ද නන්දිමිත්‍ර නාමය අමතක නො වේ. සරත් ෆොන්සේකා මහතාගේ නාමය ද අවුරුදු දහස් ගණනකට පසුව ද ජාතියේ මතකයෙන් ඉවත්විය යුතු නො වේ. සරත් ෆොන්සේකා මහතා අමාත්‍යාංශයක ලේකම්වරයකු ලෙස පත්කිරීම ඒ මහතාට කරන ගෞරවයක් නො වේ. හමුදාවෙන් විශ්‍රාම යෑමෙන් පසුව ඒ මහතාට සුදුසු එකම නිලය ජනාධිපති තනතුර ය. එහෙත් මහින්ද රාජපක්ෂ මහතා ඒ තනතුරට වඩා සුදුසු ය.

අද පොදු අපේක්ෂකයා ලෙස සරත්ලා දෙදෙනකු ගැන කියැවෙයි. හිටපු අගවිනිසුරු සරත් සිල්වා මහතා එක් අයකු වන අතර අනෙක් තැනැත්තා සරත් ෆොන්සේකා මහතා ය. පොදු අපේක්ෂකයා කවුරුන් වුව ද ඔහුට අත්වන්නේ පරාජයක් පමණකි. සරත් සිල්වා මහතා පරාජය වීම අපට ප්‍රශ්නයක් නො වේ. උතුර හා නැගෙනහිර වෙන්කිරීමේ තීන්දුව ඓතිහාසික වුවත් නොදී බැරි තීන්දුවකි. එහෙත් ඒ අතර ඒ මහතා අධිකරණ බලතල බෙදීමට ද කටයුතු කෙළේ දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනය ද ඉක්මවා යමින් බව ඇතැම් නීතිඥයන්ගේ අදහස වෙයි. සරත් සිල්වා මහතා කෙසේ වෙතත් සරත් ෆොන්සේකා මහතා පරාජය වනු දැකීමට අපි නොකැමැත්තෙමු. එහෙත් මහින්ද රාජපක්ෂ මහතාට විරුද්ධව ඒ මහතාට ඡන්දය දීමට ද අපට නො හැකි ය. එදා සරත් ෆොන්සේකා මහතා ගැලවීමේ හමුදාවටවත් නුසුදුසු යැයි කීවෝ අද ඒ මහතාට දිරවිච ලණු දෙති. ඔවුහු ෆොන්සේකා මහතාට පරාජය අත්කර අනෙක් පැත්තෙන් මහින්ද රාජපක්ෂ මහතා ලබන විශිෂ්ට ජය අඩුකිරීමට කටයුතු කරමින් එක ගලෙන් කුරුල්ලන් දෙදෙනකු මරාදැමීමට උත්සාහ කරති. අප ඒ උත්සාහය පරාජය කළ යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva